# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2028/52 - 2017 ජූලි මස 21 වැනි සිකුරාදා - 2017.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මධ්‍යම පළාතේ පළාත් සභාව 2001 අංක 1,169 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදන සංශෝධනය කිරීම

මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම වර්ෂ 1992 අංක 4 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව 2001 ජනවාරි මස 26 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති මධ්‍යම පළාතේ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ කාර්ය මණ්ඩල පිළිබඳ බලතල යටතේ 21 (2) වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

"මගී ප්‍රවාහන සේවා අධිකාරියට අදාළ වන සේ වෙනම ආයතන සංග්‍රහයක් සහ මුදල් රෙගුලාසි අනුමත කර ගන්නා තෙක් අධිකාරියේ සියලු ආයතන සහ මුදල් පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය සේවයට පොදුවේ බලපානු ලබන ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි අදාළ වේ."

එදිරිවීර වීරවර්ධන,
මධ්‍යම පළාත් සභාවේ
මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති
සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

08-223

1A – PG 3620 – 22 (2017/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*